# කුරුළු ලෑල්ල



විහූෂි සිතුත්මා ජයසුන්දර

# කුරුම්බ ලෑල්ල

විභූෂි සිතුත්මා ජයසුන්දර
(කතෘ)

පළමු දිගහැරීම

මහමායා බාලිකා විද්‍යාලය
1 ශ්‍රේණිය E

ISBN 978-624-211-470-5

# පිදුම

මෙම ග්‍රන්ථය

මාගේ ආදරණීය පන්තිභාර,

ගයානි ජයසුන්දර ගුරු මෑණියන් හට

පුදමි.

# පෙර වදන


## මහමායා බාලිකා විදුහලේ
## විදුහල්පතිනියගේ ප්‍රකාශය



විභූෂි උදේම එයාගේ ගෙවත්තට ගියා.

ලස්සන කුරුල්ලෝ ගොඩක් ඉන්නවා

එයා දැක්කා.



විභූෂිට අම්මා බත් කන්න කතා කළා.

එයා බත් කද්දී අර කුරුල්ලන්ව මතක් වුණා.

පව් කුරුල්ලෝ බඩගින්නේ....... එයාට හිතුණා.



එයා බත් ටිකක් පිඟානකට දාලා
කුරුල්ලන්ට
කන්න බිමින් තිබ්බා.



ටික වේලාවකින් විභූෂි ඇවිත් බලද්දී


බත් පිඟාන හිස්.......

කුරුල්ලන්ට හොඳටම

බඩගිනි වෙලා.

විහූෂි ආපහු බත් ගොඩක්

පිඟානකට දැම්මා.





එයා ඒ බත් පිඟාන මිදුලෙන් තියලා
හොරෙන් පඳුරකට මුවා වෙලා
බලාගෙන හිටියා
කුරුල්ලෝ එනකල්......



අනේ... විභූෂිගේ බල්ලා

ඩොටී ඇවිත්

බත් පීඟාන කනවා.

එයා අත්තාට

ඒ විස්තරය කිව්වා.



අත්තා, විභූෂිත් එක්ක එකතු වෙලා කුරුල්ලන්ට

කෑම කන්න ලෑල්ලක් උඩින් ගැහුවා.

අත්තා කීවා ඒකට කියන්නේ

"කුරුළු ලෑල්ල"

කියලා.



අත්තා හදපු කුරුළු ලෑල්ලට කුරුල්ලෝ බත් දාලා

විභූෂියි අත්තයි බලාගෙන හිටියා.

කුරුල්ලෝ ඇවිත් කෑම කනවා.

විභූෂිට හරි සතුටුයි.

සතුන්ට ආදරේ දක්වන්න ඕන කියලා අත්තා,

විභූෂිට කියලා දුන්නා.





# පසුවදන

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,**
**සෙනවිරත්න මහලේකම්,**
**ගුරුතුමාගේ ප්‍රකාශය**